# මුහුදට ගිය පොල් ගෙඩිය



දිසුලි සෙහස්නා රණරාජ

කෘතියේ නම - මුහුදට ගිය පොල් ගෙඩිය

කතෘගේ නම - දිසුලි සෙහස්නා රණරාජ

සියලු හිමිකම් ඇවිරිණි

කතෘගේ වෙනත් කෘති - පුංචි කපු පැළය

කෘතිය පළ කරන දිනය - 2023/12/18

# පිදුම

මාගේ දෙගුරුන්

වෙත.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


**2023.10.20**

ඔන්න එකමත් එක කාලෙක පුංචි ගැහැණු ළමයෙක් හිටියා . එයාගෙ නම රුසිනි . එයාගේ ගෙදර තිබුණා වැඩිය උස නැති පොල් ගසක් . හැබැයි , ඒ පොල් ගසේ මහ විශාල පොල් ගෙඩි රැසක් පිරී තිබුණා.



රුසිනි පොල් ගස දෙස බලාගෙන හිතුවා "මේ එක පොල් ගෙඩියකින් හරිම රස පොල් රොටියක් හදන්න පුළුවන් " කියාලා.

රුසිනි ලඟ තිබුණු කෙක්කකින් පොල් ගෙඩියක් කඩාගෙන ගෙදර ගියා.



පොල් ගෙඩිය කඩලා රුසිනිට හරිම මහන්සියි . රුසිනි ආලින්දයේ තිබුණු පුටුව ලඟින් පොල් ගෙඩිය තිබ්බා. රුසිනිට පුටුවේම නින්ද ගියා.



පුටුව ළඟ තිබුණු පොල් ගෙඩියට අමුතු දෙයක් වුණා. එක පාරටම පණ ආවා. දුවන්න පටන් ගත්තා . පෙරලි පෙරලි ගියා.

රුසිනි එක පාරටම ඇහැරිලා කිවුවා "පොල් ගෙඩිය දුවනවෝ ඉක්මනට අල්ලගන්නෝ "

රුසිනි මහ හයියෙන් කෑගැහුවා . රුසිනි පොල් ගෙඩිය පිටිපස්සෙන් දුවන්න පටන්ගත්තා.



පොල් ගෙඩිය දුවලා දුවලා ගිහින් ඇළට වැටුණා, ඇළෙන් ඔයට වැටුණා, ඔයෙන් ගඟට වැටුණා, ගැඟෙන් මුහුදට වැටුණා. රුසිනිට ලොකු දුකක් හිතුණා. රුසිනි අඬන්න පටන්ගත්තා.



රුසිනිගේ අම්මා ඇවිත් ඇහුවා "දුවේ ඇයි ඔයා ඇඩන්නේ ?" .

රුසිනි එකපාරටම කිවුවා "මම කඩාගත් පොල් ගෙඩිය මුහුදේ පාවි පාවි තියෙනවානෙ අම්මේ ."


Z
Z
Z

ඈ එහෙනම් පුටුව ලඟ තියෙන්නේ මොනවද? "අනේ මගේ පොල් ගෙඩිය "

"ඔව් ඔව් දුවේ ඔයා මෙච්චර වෙලා හීනයක් දැකලා තියෙන්නේ "

" යේ! දැන් මට පුළුවන් මගේ රසම රස පොල් රොටිය හදන්න . මට ගොඩක් සතුටුයි "

"ඒ විතරක් නෙවෙයි. මං ඔයාට රසම රස පොල් සම්බෝලයකුත් හදලා දෙන්නම් " අම්මා කිව්වා.

"මගේ අම්මා හරිම හොඳයි!" රුසිනි සිතුවා.




නිමි!

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ  දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී  ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

ISBN 978-624-206-812-1